IB DIPLOMA PROGRAMME
PROGRAMME DU DIPLÔME DU BI
PROGRAMA DEL DIPLOMA DEL BI

M05/1/A1SIN/SP1/SIN/TZ0/XX

22050267

**SINHALESE A1 – STANDARD LEVEL – PAPER 1**
**SINGHALAIS A1 – NIVEAU MOYEN – ÉPREUVE 1**
**SINGALÉS A1 – NIVEL MEDIO – PRUEBA 1**

Tuesday 3 May 2005 (morning)
Mardi 3 mai 2005 (matin)
Martes 3 de mayo de 2005 (mañana)

1 hour 30 minutes / 1 heure 30 minutes / 1 hora 30 minutos

---

INSTRUCTIONS TO CANDIDATES

- Do not open this examination paper until instructed to do so.
- Write a commentary on one passage only. It is not compulsory for you to respond directly to the guiding questions provided. However, you may use them if you wish.

INSTRUCTIONS DESTINÉES AUX CANDIDATS

- N'ouvrez pas cette épreuve avant d'y être autorisé(e).
- Rédigez un commentaire sur un seul des passages. Le commentaire ne doit pas nécessairement répondre aux questions d'orientation fournies. Vous pouvez toutefois les utiliser si vous le désirez.

INSTRUCCIONES PARA LOS ALUMNOS

- No abra esta prueba hasta que se lo autoricen.
- Escriba un comentario sobre un solo fragmento. No es obligatorio responder directamente a las preguntas que se ofrecen a modo de guía. Sin embargo, puede usarlas si lo desea.

පහත දැක්වෙන ඡේද අතුරින් එකක් සඳහා විවරණයක් සපයන්න.

1 (අ)

## ගමේ වැව

වැලි මාවත් ලෙසින් ඇති ගං හෝ    දොළය
උණුසුම උරා බී ගති වැව්වල    ජලය
හැම තැන ගසාගෙන යන වියළුණු    කොළය
ගිනියම් සුළඟ තුළ ඇත ලෙඩකර    බලය

බොන්නට නාන්නට ඇති මේ ගමෙහි    වැවේ
දැන්නම් අඩියකට වැඩියෙන් වතුර    නොවේ
දුන්නත් පැහැය කළු නයෙකුගෙ දිරුණ    හැවේ
පැන් ටික කුමන රසයද ගැමියනගෙ    දිවේ

ඉව කර වන සතුන් එන පවසින්    වතුර
වැව හැම තැනම මී හරකුන් ඇත    වැතිර
පවතින පල් වෙච් දිය නොගොසින්    බැහැර
පවසට මොවුන්ගේ වේ මිහිරෙන්    මිහිර

අවුවට මැරි කුඩ මස්සන් කුණුවෙ    නවා
දිය කළතමින් කන කොක් වැළ පොර    කනවා
අලිබෙටි හරක් බෙටි වතුරට දිය    වෙනවා
අලියාවැටුන වැව මේ වැව් දිය    බොනවා

තැති ගත් කිරළ වැළපුම වැව දෙසින්    ඇහේ
දෙනුවන් පිනන දෙය නැත බැලූ නමුදු    කොහේ
ගින්නෙන් දා විනාසව ගොස් නිකිණි    මහේ
නිල් තණ පතක සේයාවක් නොමැත    මෙහේ

සෙවණැලි පවා මැලි ගතියෙන් පොළොව    මත
වැතිර තිබේ අද ගී අමතකව    ඇත
ඉදිරියෙ අවට මිරිඟුව ඇත වසා    නෙත
ඉදලක් සැලෙන තරමට සුළඟකුත්    නැත

ලැව්ගිනි නැගෙන තරමට පවතින    ගින්නේ
බිහිසුණු විජ්තයක රුදු වග වල    සුන්නේ
මෙලෙසින් කටුක ජිවිතයක් ගෙන    යන්නේ
අප වැනි අයම බව නැත සමහරු    දන්නේ

විමලරත්න කුමාරගම, එකතු කළ කවි, 1987

- මෙම කවි පෙළෙහි ප්‍රධාන තේමාව කුමක් ද?

- වැව හා අවට පරිසරය පිළිබඳව ඔබ තුළ හටගන්නේ කවර හැඟීම් ද?

- හැඟීම් දැනවීම සඳහා කවියා භාෂාව හා රචනෝපක්‍රම භාවිත කරන ආකාරය පරීක්ෂා කරන්න.

- මේ වර්ණනය ඔබගේ සිත් ගනී ද? හේතු දක්වන්න.

**1. (ආ)**

“අපි සියල්ලෝ ම ඔබගේ නියමයට කීකරු වෙමු. පෘතුගාලයත්, රජුත්, වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයට සූදානම් වෙමු,” යනුවෙන් නැවතත් තිලධාරි මණ්ඩලය එක හඬින් කීහ.

“එ සේ නම් ජයවර්ධන පුරය ගනිමු! සිංහලයන් නසමු!” මෙ සේ පවසා, **ද් ලසර්දා** “යුද්ධය! යුද්ධය! යුද්ධය ම වේවා! අවසානය වන තෙක් යුද්ධය ම වේවා!” යි ද ප්‍රාර්ථනය කළේ ය.

“අහෝ! තොපගේ සැහැසිකම්වල ඉමක්කොනක් නැත්තේ ද? යුද්ධය ම– යුද්ධය ම– වේවා! කියා තොප මේ පතන්නේ තොපට කවර වරදක් කළ සතුරු පිරිසකට විරුද්ධව ද? තොපට අනුකම්පා කොට, තොපගේ වෙළෙඳාම සිත් සේ තොපට කර ගැනීමට ඉඩකඩ සලසා දී, ආගන්තුක සත්කාරයෙන් තොප සැනසූ, කරුණාවත් ජාතියකට විරුද්ධව ද? තොපගෙන් මෙ රට අහිංසක මිනිසුන්හට විනා, කිසි කලකත් එම මිනිසුන්ගෙන් තොපට වරදක් වී ද? ඔවුන් යම් ලේ වැගිරීමක් කළා නම් කෙළේ, තොපගේ සැහැසි කම්වලින් ආත්මාරක්ෂාව ලබන අටියෙන් විනා, වෛරයකින් නොවේ. තොප ඔවුන්ගෙන් පහර කෑවා නම්, ඒ කෑවේද. තොපගේ නොහික්මුණු නොදමුණු කම නිසා ම ය. ඔවුන් තොප පළමුවෙන් පිළිගත්තේ, කො තරම් හිතවත් කමකින් ද? තොපට කෑම්–බීම් සැපයීමෙන්, ඉඳුම්–හිටුම් දීමෙන්, සියලු ඕනෑ–එපා කම් පිරිමැසීමෙන්, කළ සංග්‍රහයට තොප මේ කෘතඥ වන සැටි ද? තොපගෙන් මෙ තෙක් කෙරුණු තරමක් කෙරුණේ, ගුණමකු කම් විනා, වෙන කුමක් ද? තොපි කිසි කලක ගනු-දෙනුවලින් වත්, හැසිරීමෙන් වත්, කතා බහින් වත්, අවංක වූවහු ද? කාල කන්නි මනුෂ්‍යයෙනි, තොප කළ සියලු වල් කම්, නොතරම් කම්, මම මේ යුගැසින් දුටුවෙමි. මෙ රට මිනිසුන් තොප පිළිගත්තේ දෙවියන් මෙන් ය. එහෙත් තොප ඔවුන්ට සැහැසි කම් කෙළේ, යකුන් මෙන් ය—.”

“කුපිකෙසෑඩෝ!” කියා මෙහි දී දෙව් ගැති තුමාගේ අවලාදයෙන් කිපුණු **ද් ලසර්දා** ගිගුම් දුන්නේ ය.

“ද් ලසර්දා, මට ඇහුන්කන් දෙව. සෙන්පතිවරුනි, මට ඇහුන්කන් දෙව්. තොපට දෙවියන්ගෙන් මේ බලපුළුවන් කම ලැබුණේ, අහිංසකයන් පෙළන්නට නොවේ. අහිංසකයන් රකින්නට ය. එ හෙයින් මම තොපගෙන් එක ඉල්ලීමක් ඉල්ලමි. ඊයේ රෑ කළා වැනි පාපිෂ්ඨ අපරාධ ක්‍රියා තවත් නොකරන හැටියට මම උදක් ඉල්ලමි. මිනී ගසා ගෙන කන මිලේච්ඡයන් වත් නොකරන මේ අධම ක්‍රියා පරිපාටිය මෙ පමණකින් නතර කරන හැටියට ඉල්ලමි. මේ සිංහලයෝ ඉතා ම ශිෂ්ටයෝ ය. සමාදානයෙන් ක්‍රියා කරන්නන්හටත්, අවංක සිතින් ගනු–දෙනු කරන්නන්හටත්, ඔවුන්ගෙන් වුවමනා නිදහසක් ලබා ගත හැකි යි. තොප මේ සතුරන්ය කියන ඒ මනුෂ්‍යයන් වෙත සමාදානයේ දූතයකු මෙන් මම යනු කැමැත්තෙමි. එ සේ ගොස් ඔවුන්ගේ ආශීර්වාදයත්, ගෞරවාදරයත්, තොපට ලබා දෙන්නට කැමැත්තෙමි. මට ඊට ඉඩ දියව්, ඔ වැනි අපරාධ තවත් කරන්නට නොසිතව්.” මෙ සේ කියමින් දෙව් ගැති තුමා හමිදුම්මාගේ ඉකි ගැසුමක් ශ්‍රවණය කොට “දුව, වැලපෙන්නේ, තී පමණක් ද? තිගේ මෙන් මොවුන්ගේ ද සිත් මොළොක් නොවන්නේ මන්ද?” කියා සළිත් ප්‍රශ්න කළේය.

“ඇය ද, ඔබ ද, හැර මෙහි අන් ගැහැනුන් නැති බව නොපෙනෙන්නෙහි දැයි?” **ද් ලසර්දා** ඊට පිළිතුරු දුන්නේ ය.

**ඩබ්ලිව් .ඒ . සිල්වා, විජයබා කොල්ලය**, 1953

- මෙම පාඨයෙහි සඳහන් පුද්ගලයන් පිළිබඳ කවර චරිත ලක්ෂණ මෙයින් හෙළි වේ ද?

- මෙහි සඳහන් පුද්ගලයන් අතර සම්බන්ධය පිළිබඳ කවර අදහස් පළකළ හැකි ද?

- මෙම අවස්ථාව පිළිබඳව කවර හැඟීම් පාඨකයා තුළ හට ගනී ද?

- හැඟීම් දැනවීම සඳහා භාවිත කොට ඇති භාෂාව හා රචනෝපක්‍රම පරීක්ෂා කරන්න.